

# එකවර රන් පදක්කම් හතරක් ම ලබාගත් අපේ පුංචි ක්‍රීඩා ශූරියක් !

# ෂෙහානා

අපි මාධ්‍ය තුලින් බොහෝ දේ කතා කරන්නෙමු. අසා, කියවා, දැක රස විඳින්නෙමු. එහෙත් අපගේ අනාගතය වන දරුවන් පිළිබඳව කතා කරන, අසන, කියවන දකින දේ ප්‍රමාණවත් දැයි නිරතුරුවම සිතේ. ඒ නිසා ම අපගේ දරුවන් පිළිබඳව යමක් ලිවීමට ලැබෙයිනම් එය මහත් වූ සතුටකි.

දරුවන් පිළිබඳව වුව අප වැඩිපුර කතා කරන්නේ ඔවුන්ගේ කලා කුසලතාවයන් පිළිබඳවයි. අධ්‍යාපනික හෝ ක්‍රීඩා හෝ වෙනයම් ජයග්‍රහණයක් ගැන සාකච්ඡා කිරීම ද විරලයි. මිල්පාර්ක් හයිට්ස් (Milpark Heights Primary) ප්‍රයිමරි විද්‍යාලයේ ඉගෙනුම ලබන ෂෙහානා විජේසූන්දර දැරිය අපට ගෙන ආයේ එවන් විරල ජයග්‍රහණ පෙළක් පිළිබඳව සුභා රංචියකි. ඇය මේ හපන්කම් පාන්නේ මලල ක්‍රීඩිකාවක ලෙසයි.



"ලිට්ල් ඇත්ලටික් වික්ටෝරියා" (Little Athletic Victoria) විසින් පවත්වනු ලබන "ස්ට්‍රේට් ට්‍රැක් ඇන්ඩ් ෆීල්ඩ්" (State Track and Field) මලල ක්‍රීඩා තරගාවලියේ වයස අවුරුදු දහයෙන් පහළ ඉසව් හතරක් සඳහාම රන් පදක්කම් දිනා ගැනීමට ෂෙහානා දියණිය සමත් වූවාය. ඒ මීටර් 80 කඩළු පැන දිවීම, මීටර් 60 කඩුළු දිවීම, දුර පැනීම, තුන් පිම්ම යන ඉසව් හතර සඳහායි. වයස අවුරුදු දහයෙන් පහළ දරුවකුට ඉදිරිපත් විය හැකි වැඩිම ඉසව් ප්‍රමාණය වන ඉසව් හතරක් සඳහා ඉදිරිපත් වෙමින් ඒ ඉසව් හතරෙන්ම රන් පදක්කම් ලබා ගැනීම සැබැවින්ම විරල අවස්ථාවකි.

"ඇල්බට් පාර්න් ලේක් සයිඩ්" ක්‍රීඩාගාරයේ පැවැත්වීමට යෙදුණ මෙම තරගාවලියේදී ෂෙහානා මීටර් 80 හා 60 කඩුළු පැනීමේ තරග වලින් වික්ටෝරියානු ප්‍රාන්තයේ තරග වාර්තා බිඳ හෙළීමට ද සමත් වූවාය. ඇය පිළිබඳව තොරතුරු දැන ගැනීමට අපි ඇයගේ දෙමව්පියන් වන සමන් හා ප්‍රීති විජේසුන්දර යුවල ඇමතුවෙමු.

"දුව ක්‍රීඩා කරන "වීට්ල්සි" (Whittlesea) ක්‍රීඩා සමජය අයිති වෙන්නේ "නොදර්න්න් මෙට්‍රොලිටන්" (Northern Metropolitan) එකට". සමන් කතාවට මුලපිරුවේය. උතුරු නාගරික ප්‍රදේශයට අයත් "වීට්ල්සි" ක්‍රීඩා සමාජය තුළ පෑ දස්කම් බොහෝමයි.

ඒ පිළිබඳව මුලින් ම අප දැනුවත් කළ සමන් අනතුරුව ඇයගේ නවතම ජයග්‍රහණ පිළිබඳව විස්තර කිරීම ඇරඹුවේය.

"අපේ ප්‍රදේශය වගේ වික්ටෝරියාවේ තියෙන අනික් ප්‍රදේශ අටක් හෝ මේ තරගාවලියට ළමයින් ඉදිරිපත් කරනවා. මුළු වික්ටෝරියාවේ ම තියෙන ක්‍රීඩා සමාජ සීයක විතර ළමයින් දෙදාහක් විතර මූලිකව මේ තරඟවලට ඉදිරිපත් වෙනවා. ඉසව් දොළහකින් විතර. ඉතින් උතුරු ප්‍රදේශයේ "නොදර්න් රීජනල් ට්‍රැක් ඇන්ඩ් ෆීල්ඩ්" (Northern Regional Track & Field) තරඟාවලියේ උපරිම දක්ෂකම් පෙන්වන දරුවන් 24 දෙනෙක් විතරයි වික්ටෝරියා ප්‍රාන්තයේ "ස්ට්‍රේට් ට්‍රැක් ඇන්ඩ් ෆීල්ඩ්" තරඟාවලියට ඉදිරිපත් කරවන්නේ. ප්‍රාදේශීය වගේ ම ප්‍රාන්ත තරඟාවලි දෙකම පවත්වන්නේ "ලිට්ල් ඇත්ලටික්ස්, වික්ටෝරියා" ම යි."

"ප්‍රාදේශීය තරඟාවලියේ අපේ දුව ඉදිරිපත් වුණ ඒ ඉසව් තුනකම ප්‍රාදේශීය වාර්තා බිඳින්න දුවට පුළුවන් වුණා. ඒ ප්‍රාදේශීය තරඟාවලියේදීමයි මීටර් 80 කඩුළු දිවීම ප්‍රාන්ත වාර්තාවත් දුවට බිඳින්න පුළුවන් වුණේ."

"පහුගිය මාර්තු 28, 29 සති අන්තයේදීයි වික්ටෝරියානු ප්‍රාන්ත තරඟාවලිය පැවැත් වුණේ. මීටර් 80 කඩුළු දිවීමේ වික්ටෝරියානු වාර්තාව වුනේ තත්පර 13.89. ඒ වාර්තාව ෂෙහානා මූලික තරගවලදී බිඳ දැම්මේ තත්පර 13.86 කාලයන් වාර්තා කරලා. අවසන් තරගයේ දී එයා එයාගෙම වාර්තාව බිඳ දැම්මේ තත්පර 13.78 ක කාලයකින් තරඟය ඉවර කරලා. එදා ම තිබුණ දුර පැනීමේ තරගය ඇය දිනුවේ මීටර් 4.34 දුර පැනලා. මීටර් 60 කඩුලු දිවීමේ කලින් වාර්තාව වෙලා තිබුණේ තත්පර 10.44 යි. ෂෙහානා මූලික තරඟවලදීම ඒ වාර්තාව බිඳ දැම්මේ තත්පර 10.43කින්. එදාම හවස් වරුවේ එයා එයාගෙම වාර්තාව බිඳ දැම්මා තත්පර 10.41ක කාලයකින් තරගය ඉවර කරලා. තුන් පිම්ම ඉසව්ව දුව දිනුවේ මීටර් 9.53 දුර පැනලයි."

වයස අවුරුදු 10 පහළ දරුවන් හට ඉදිරිපත් විය හැකි ඉහළම තරගාවලියයි ප්‍රාන්ත තරගාවලිය. ඒ සඳහා එක දරුවකු හට අවසර ඇත්තේ ඉසව් හතරකට පෙනී සිටීමට පමණකි. ඒ ඉසව් හතරින් ම රන් පදක්කම් ලබා ගැනීම ම අසම සම වාර්තාවක් නොවේ ද ?



"පහුගිය ජනවාරියේ පැවැත්වුණ "ස්ටේට් මල්ටි ඉවෙන්ට්ස්" (State Multi Events) ප්‍රාන්තයේ විවිධ ක්‍රීඩා ඉසව් තරඟාවලියටත් ෂෙහානා ඉදිරිපත් වුණා. මීටර් 100 හා 80 කඩුළු දිවීම, දුර පැනීම, මීටර් 800 දිවීම, යග්ගුලිය දැමීම තරග ඉසව් පහට ම. දක්ෂ ළමයින්ට විතරයි ඒකට ඉදිරිපත් වෙන්න පුළුවන්. මොකද ඉදිරිපත් වෙන හැමෝටම ඒ ඉසව් පහට ම පෙනී හිටින්න වෙනවා. ඒ තරඟාවලියෙන් ලකුණු 1022 ක්




අරගෙන ෂෙහානා වික්ටෝරියාවේ ම දෙවන තැන දිනා ගත්තා. ඒ කියන්නේ රිදී පදක්කම. "ස්කූල් ස්පෝර්ට්ස් වික්ටෝරියා" (School Sports Victoria) පාසල් තරඟාවලියේ තුන් පිම්ම ඉසව්වෙන් රිදී පදක්කමත් ලබාගත්තා. ඒ වගේම "ස්කූල් ස්පෝර්ට්ස් වික්ටෝරියා" පිරිනමන "අවුට්ස්ටෑන්ඩිං ඇකඩමික් ඇන්ඩ් ස්පෝර්ට් අචීව්මන්ට්" (Outstanding Academic and Sport Achievement) කියන විශිෂ්ඨ අධ්‍යාපනික හා ක්‍රීඩා ජයග්‍රහණ වෙනුවෙන් දෙන දුර්ලභ සම්මානයත් දුව ලබාගත්තා."

අනෙකුත් ක්‍රියාකාරකම් සමඟ අධ්‍යාපන කටයුතු සමබරව පවත්වාගෙන යාම දරුවන්ට මෙන් ම ඔවුන් ඒ සඳහා යොමු කරවන දෙමව්පියනට ද අභියෝගයකි. ෂෙහානා මෙන් ම ඇයගේ වැඩිමල් සොයුරිය වන නතාෂා ව ද ගායනය, නර්තනට වැනි දේට පවා යොමු කරවා ගෙන යන මේ ගමනට දරුවන්ට මෙන්ම විජේසුන්දර දෙපළට ද, දිරිය ශක්තිය වාසනාව ලැබේවා ! යි අපි පැතුවෙමු.

ෂෙහානා දැරියගේ ක්‍රීඩා සමාජයේ මොරීන් රෙනෝල්ඩ්ස් (Ms. Morureen Reynolds) උපදේශිකාවරියවත් ක්‍රෙග් චැප්මන් (Mr. Craig Chapman) උපදේශකවරයාවත් සිහිපක් කරනා මෙන් ඉල්ලමින් සමන් හා ප්‍රීති යුවල දස වසර සපුරන "සන්නස"ට සුබ පැතූහ.